පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක : 79

ආයතනයේ නම : කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය

පාර්ලිමේන්තුවේ රජයේ ඇස්මුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119(4) යටතේ ගරු අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.

நாடாளுமன்றத் தொடர் எண்: 79

நிறுவனத்தின் பெயர் : தொழில் மற்றும் வெளிநாட்டு வேலைவாய்ப்பு அமைச்சு

கௌரவ அமைச்சரின் அவதானிப்புகளை பாராளுமன்றத்திற்கு சமர்ப்பித்தல் மற்றும் பாராளுமன்றத்தின் பொதுக் கணக்குக் குழுவினால் சமர்ப்பிக்கப்பட்ட அறிக்கைகளின் பிரகாரம் நிலையியற் கட்டளை 119(4) இன் கீழ் எடுக்கப்பட வேண்டிய நடவடிக்கைகள்

Parliamentary Series No: 79

Name of the Institution: Ministry of Labour and Foreign Employment

Submission of observations of Hon. Minister and steps taken with regard to the reports tabled by the Committee on Public Accounts in term of Standing Oder No. 119(4)

<u>කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය</u>

<u>පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක **119(4)** යටතේ ගරු අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.</u>

<u>කමිටුව විසින් හඳුනාගෙන ඇති අඩුපාඩු</u>	<u>අඩුපාඩු නිවැරදි කිරීමට ආයතනය ගෙන ඇති ක්‍රියාමාර්ග / වර්තමාන ප්‍රගතිය</u>
<u>පළමු කොටස : **94.00**</u> **2017.06.26** දිනැති අංක **01/2017** දරන වත්කම් කළමණාකරන චක්‍රලේඛයේ **7** ඡේදය ප්‍රකාරව **2018** වර්ෂයේ මිලදී ගන්නා ලද වත්කම් හා අපහරණයන් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර නොතිබුණි.	වත්කම් කළමණාකයණ චක්‍රලේඛ අංක 02/2023 පරිදි රජයේ මූල්‍ය නොවන වත්කම් කළමණාකරන වාර්ථාව 2022 වර්ෂයට අදාලව 2023.03.10 දිනැතිව කොම්ප්ට්‍රොලර් ජනරාල් වෙත ඉදිරිපත් කර ඇත.
සියලු වාහන වල රාජ්‍ය ලාංඡනය පින්තාරු කර නොතිබුණි.	අමාත්‍යාංශයේ වාහන සඳහා රාජ්‍ය ලාංඡනය හා අමාත්‍යාංශයේ නම පින්තාරු කිරීමට රජයේ කර්මාන්තශාලා දෙපාර්තුමේන්තුව වෙතින් ඇස්තමේන්තුවක් ලබා ගැනීමට කටයුතු කර ඇත.
වාහනයක් ගර්හිත වී මාස **8** වඩා අඩු කාලයකදී අපහරණය කර නොතිබුණි.	KA – 2670 අංක දරණ වාහනය අළුත් වැඩියා කිරීම ආර්ථික වශයෙන් ඵලදායි නොවන බැවින් 2023.10.03 වන දින ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කර විකිණීමට කටයුතු කර ඇත.
වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන නිහ ණය ශේෂ පැවතුණි.	අත්තිකාරම් ගිණුම් ණය ශේෂ අයකර ගැනීම සම්බන්ධයෙන් පහත සඳහන් ක්‍රියාමාර්ග ගෙන තිබේ. • **ඩබ්.ඩී.ජී.සී.සුගතදාස මිය (රාජ්‍ය කළමණාකරණ සහකාර)** **1.** ඩබ්. ඩී. ජී. සී. සුගතදාස මහත්මියගේ හිග ණය ශේෂ මුදල රු .138,501/= ක් වේ. **2.** ඇය පූර්ණ දැනුම් දීමකින් තොරව විදේශ ගතවී ඇති බැවින් මෙම ණය ශේෂ අයකර ගැනීමේ කටයුතු නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමුකර ඇති අතර ඇයට විරුද්ධව නඩු පැවරීමට කටයුතු කර ඇත. **3.** ඉහත කරුණු සැලකිල්ලට ගෙන අමාත්‍යාංශය මගින් ඉදිරි ණය ලබාදීමේදී රක්ෂණ ඔප්පු ඇප මත ණය ලබාදීම නවතා පුද්ගල ඇප මත පමණක් ණය ලබාදීමට අවශ්‍ය පියවර ගෙන ඇත.

- **වී.පී.සී.ද මෙල්**
  (කාර්යාල කාර්යය සහයක)

වී. පී. චින්තක ද මෙල් මහතා විසින් ලබාගෙන ඇති රු. 114,575.60 ක ණය මුදල අය කර ගැනීමට අවශ්‍ය පියවර ගනිමින් පවතී.

එම නිලධාරියා වෙනත් කාර්යාලයකට ස්ථාන මාරු වී ගිය නමුත් එම කාර්යාලයේ රාජකාරී භාර නොගැනීම හේතුවෙන් සේවය හැරයාමේ නිවේදනයක් නිකුත්කර තිබේ. ඔහු පදිංචි ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම්තුමාගේ සහය ලබාගෙන ණය ශේෂ අයකර ගැනීමට අවශ්‍ය කටයුතු කිරීමේදී ණය මුදල ගෙවීමට හැකියාවක් නොමැති බව ප්‍රාදේශීය ලේකම් දන්වා තිබූ බැවින් එම ණය මුදල කපා හැරීම සඳහා භාණ්ඩාගාරය වෙත යොමු කරන ලදී. රජය මගින් ලබාදෙන මූල්‍ය සහනාධාරයක් ඔහු ලබාගන්නේද පිළිබඳව විමසීමක් කල යුතු බව භාණ්ඩාගාරය විසින් දන්වා තිබූ බැවින් ප්‍රාදේශීය ලේකම් වෙතට චාර්තාවක් ලබා දෙන ලෙස ඉල්ලීමක් හා නැවත සිහි කැඳවීමක් ද යොමු කර තිබේ.

- **පී.බී.එස්.කුමාර (රියදුරු)**

රියදුරු පී. බී. එස්. කුමාර මහතාගෙන් අයවිය යුතු රු. 44,541/= ක ණය මුදලින් රු. 5,000/= බැගින් අයකරමින් පවතින අතර 2024 ජූලි 31 දින වන විට ණය ශේෂය රු. 14,541/= ක් දක්වා අඩුකර ගැනීමට හැකිවී තිබේ.

- **කේ.පී.ද සිල්වා - ආපදා රු. 188,400.00**

විශ්‍රාම වැටුපින් මාසිකව අයකර එවනු ලබයි. 2024.06.30 දිනට අයවිය යුතු ශේෂය රු. 98,400.00 කි.

- **ආර්.ඩී.එස්.ප්‍රියදර්ශන - ආපදා රු.128,069.00**

බෙන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙහි සේවය කරන ඔහුගේ බිරිඳගේ මාසික වැටුපෙන් ණය ශේෂය අයකිරීම සිදු කරනු ලබයි. 2024.06.30 දිනට අයවිය යුතු ශේෂය රු.53,360.00 කි.

- **කේ.වෙල්ලප්පිලි - ආපදා රු.95,730.00, විශේෂ රු.2,000.00**

2016 වසරේ සිට ණය මුදල ගෙවන ලෙස දන්වා ලිපි හා සිහිකැඳවීමේ ලිපි යවා ඇත. පසුව 2021.01.15 හා 2021.03.26 දිනයන්හි මාතර ප්‍රාදේශීය ලේකම් වෙත යොමු කල ලිපි මඟින් කේ.වෙල්ලප්පිලි මහතාට ආපදා ණය

මුදල ගෙවීමට ඇති හැකියාව පිළිබඳ විමසා ඇති අතර. ඔහු එම මුදල් ගෙවීමට නොහැකි තත්වයක සිටිනා බව දන්වා එම ප්‍රදේශයේ ග්‍රාම නිලධාරි විසින් වාර්තා කර ඇත.

මේ සම්බන්ධව නීතිපති වෙත උපදෙස් විමසා ඇත.

2023.10.25 දිනැති ලිපිය මඟින් මෙම නිලධාරියා ණය ගෙවීමට හැකි ආර්ථික මට්ටමක සිටින්නේදැයි යන්න ග්‍රාම නිලධාරි ලවා ලිඛිත තහවුරුවක් මඟින් දන්වන ලෙස මුලටියන ප්‍රාදේශීය ලේකම් වෙත දන්වා යවා ඇත.

මේ සම්බන්ධයෙන් ප්‍රාදේශිය ලේකම්ගේ නිර්දේශ ලැබීමෙන් පසු ඉදිරි කටයුතු සිදු කරනු ඇත.

- **ආර්.එල්.සී.එස්.පෙරේරා - ආපදා**
  රු. 104,580.00, විශේෂ රු.4,000.00

2016 වසරේ සිට ණය මුදල ගෙවන ලෙස දන්වා ලිපි හා සිහි කැඳවීමේ ලිපි යවා ඇත. ජාතික රක්ෂණාභාර අරමුදල ඇපයට තබා ණය ලබාගෙන ඇත. ණය සුරැකුම්පතෙහි 2 (ආ) වගන්තිය අනුව සේවය හැරගිය අවස්ථාවකදී හිඟ ශේෂය ගෙවීමට නොහැකිව ඇත.

2021.01.15 හා 2021.03.26 දිනයන්හි දොම්පේ ප්‍රාදේශිය ලේකම් වෙත යොමු කල ලිපි මඟින් ආර්.එල්. සි.එස්.පෙරේරා මහතාට ආපදා ණය මුදල ගෙවීමට ඇති හැකියාට පිළිබඳ විමසා ඇත. එයට පිළිතුරු වශයෙන් 2021.11.30 දිනැති ලිපිය මඟින් ඔහුට එම මුදල් ගෙවීමට නොහැකි තත්වයක සිටිනා බව දන්වා එම ප්‍රදේශයේ ග්‍රාම නිලධාරිගෙන් තහවුරු කර ලිපියක් යොමුකර ඇත.

නිගණය මුදල් ගෙවන ලෙස දන්වා යොමු කළ ලිපි වලට පිළිතුරක් නොමැති හෙයින් 2020 ඔක්තෝම්බර් මස මේ සම්බන්ධව ඉදිරි කටයුතු සඳහා උපදෙස් විමසා නීතිපති වෙත ලිපියක් යොමු කර ඇත.

2023.10.25 දිනැති ලිපිය මඟින් මෙම නිලධාරියා ණය ගෙවීමට හැකි ආර්ථික මට්ටමක සිටින්නේ දැයි යන්න ග්‍රාම නිලධාරි ලවා ලිඛිත තහවුරුවක් මඟින් දන්වන ලෙස දොම්පේ ප්‍රාදේශිය ලේකම් වෙත දන්වා යවා ඇත. ඊට පිලිතුරු වශයෙන් ආර්.එල්.සී.එස්. පෙරේරා මහතා දැනට ස්ථීර රැකියාවක නිරත නොවන බව වාර්තා කර ඇත. එමෙන්ම මොහුට නඩු කටයුතු සිදු කරමින් පවති.

- **ඕ.කේ.ඩී සුසිත් - විශේෂ**
  රු. 2,400.00, උත්සව. 8,750.00

2016.11.25 දිනැති ලිපිය මඟින් ඔහු රැකියාවක් ලද පසු මුදල් ගෙවන බව ලිපියක් මඟින් දන්වා ඇතත් මේ වන තෙක් ගෙවා නොමැති හෙයින් 2016 වසරේ සිට වරින්වර ණය මුදල ගෙවන ලෙස දන්වා ලිපි හා සිහිකැඳවීමේ ලිපි යවා ඇත.

ඕ.කේ.ඩී.සුසිත් මහතා හා ඔහුගේ දරුවන් රැකියාවක් කරන බව 2023.12.19 දිනැති ලිපිය මඟින් කෝට්ටේ ප්‍රාදේශීය ලේකම් විසින් දන්වා එවා ඇත.

- **කේ.ප්‍රභාකරන් -**
  උත්සව අත්තිකාරම් - රු. 2,500.00

2018.12.10 දින විදේශගත වී ඇති බැවින් හා නැවත මෙරටට පැමිණි බවට වාර්තා නොවුන බැවින් ණය ශේෂය කපා හැරීමට අනුමැතිය ලබා දී තිබේ.

- **ආර්.එම්.එල් ජෙසිල්**
  ආපදා රු.173,954.00

ණය ශේෂය මාසිකව පියවන බවට දැනුම් දී ඇත. ඒ අනුව 2024 ජුලි මාසයේදී රු. 3,000.00 ක් ගෙවා ඇත.

- **පී.ජයප්‍රකාශ් - ආපදා රු.176,824.00**

ණය මුදල ගෙවන ලෙස වරින් වර දන්වා ලිපි යවා ඇත. පසුව ඔහු කෘෂිකර්ම අමාත්‍යාංශයේ සේවයේ යෙදී සිටියදී ලබාගත් ණය මුදලක් වන බැවින් ඇපකරු පිළිබඳ තොරතුරු ඉල්ලුම් කරමින් කෘෂිකර්ම අමාත්‍යාංශ ලේකම් වෙත 2023.02.28 දින ලිපියක් යොමු කර ඇත.

2023.07.18 දින ඇපකරු වෙත ඉතිරි ණය මුදල ගෙවන ලෙස දන්වා ලිපියක් යොමු කර ඇත. මේ සම්බන්ධව සාකච්ඡා කිරීමට නිලධාරියා අමාත්‍යාංශයට පැමිණෙන බව දැන්වුවත් මේ වන තෙක් පැමිණියේ නැත.

2024.02.10 දින ආගමන විගමන පාලන ජනරාල් වෙත ඇපකරු සම්බන්ධ කර ණය අය කර ගැනීමට අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙස දන්වා ලිපියක් යවා ඇත.

විදේශාධාර සම්බන්ධයෙන් **1994.04.20** දිනැති අංක **30/94** දරණ රාජ්‍ය ගිණුම් වක්‍ර ලේඛනේ විධිවිධාන ප්‍රකාරව අවශ්‍ය ක්‍රියා මාර්ග ගෙන නොතිබුණි.	මේ වන විට ආසියානු ඵලදායිතා සංවිධානය මගින් ලැබෙන සියලුම ප්‍රදානයන් සම්බන්දව රාජ්‍ය ගිණුම් වක්‍රලේක අංක 30/94 පරිදි කටයුතු කරනු ලැබේ.
විදේශ ප්‍රදාන ලෙස ලැබී තිබුණ සියලු මුදල් භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්ගේ නිල බැංකු ගිණුම වෙත ප්‍රේෂණය කර නොතිබීම.	ආසියානු ඵලදායිතා සංවිධානය මගින් ලැබෙන සියලුම ප්‍රදානයන් 2023 නොවැම්බර් මාසයේ සිට භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ නිල බැංකු ගිණුමට සෘජුව ප්‍රේෂණය කරනු ලබයි.
<u>දෙවැනි කොටස : **88.00**</u> සමස්ථ කාර්ය මණ්ඩලය ඇතුළත්ව කාර්ය සාධන ගිවිසුම් සකස් කර ගිවිසුම් ගතව නොතිබුණි.	02/2018 වක්‍රලේක අනුව වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් කළ යුතු වුවත් එම ගිවිසුම සකස් කරන ආකාරය පිළිබඳ අපහැදිලිතාවයක් පැවතුණි. ඒ පිළිබඳ රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය වෙතින් ප්‍රමාණවත් පැහදිලි කිරීමක් නොලැබුණි. 2023.11.30 දිනැති 2/2018 (i) සංශෝධිත වක්‍රලේඛය අනුව වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් කිරීම තවදුරටත් අවශ්‍ය නොවන බව දන්වා ඇත.
සැලසුම්ගත පුහුණු අවස්ථාවලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50% ට වඩා අඩු මට්ටමක පැවතුණි.	රාජ්‍ය වියදම් පාලනය කිරීම මැයෙන් ජාතික අයවැය වක්‍රලේඛ 03/2022 පරිදි වියදම් කළමණාකරනය කිරීම හේතුවෙන් ප්‍රතිපාදන ඉතිරිවිය.
ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය, යටත්ව මට්ටමේ/ ව්‍යාවන මට්ටමේ/ අභිතකර මට්ටමේ විය.	2022 වර්ෂයේ දී ගිණුම් පිළිබඳ විගණන මතය තත්වාගණනය කරන ලද විගණන. මතයක් වුවද 2023 වර්ෂයේදී පැහැදිලි මතයක් ලැබී ඇති බව දන්වමි.

රනිල් වික්‍රමසිංහ
කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය